# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම් අංක 08 - 2020
## මව්බස

Name / Index No :........................................................ **Grade 3**

**2020.05.26 සිට 2020.06.01 දක්වා මව්බස වැඩ පැවරුම කරවන්න.**

**3 ශ්‍රේණිය සියලුම පන්ති සඳහා - දෙවන වාරය**

වැඩ පැවරුම සිදුකිරීම සඳහා උපදෙස්,

- ❖ මෙම වැඩ පැවරුමේ දිනය යොදා දිනට නියමිත වැඩ මව්බස ලිවීම පොතේ කරවන්න. පිළිවෙළින් අලවන්න.
- ❖ මෙම පැවරුමේ ඇතැම් කොටස් " සිංහල පැවරම් " ( ඡේද කපන පොත ) හි තිබේ. එම පොතෙන් එම කොටස දරුවා ලවාම කපා පිළිතුරු ලියා අලවන්න.
- ❖ අසා ලිවීම අදාල පොතේ සිදු කරවන්න.
- ❖ දරුවා පැවරුම සිදුකර අවසාන වූ පසු සහය වන වැඩිහිටියා විසින් වැරදි යමක් වේ නම් එය යටින් තද නිල් පැහැ පාට පැන්සලෙන් යටින් ඉරක් අඳින්න. එයට ඉදිරියෙන් දරුවා ලවාම නිවැරදි පිළිතුරු ලියවන්න.
- ❖ පාඩමට අදාළ Whatsapp මගින් Video Clips, Audio Clips එවා ඇත්නම් පෙන්වා දී පැහැදිලි කර දෙන්න.

**2020/05/26 අඟහරුවාදා දිනට**

- ඔබ වෙත Whatsapp මගින් එවා ඇති Audio Clips ප්‍රවෘත්ති ප්‍රකාශයට හොඳින් සවන් දෙන්න. අනතුරුව පැවරුමට අදාළ ප්‍රශ්නවලට ප්‍රවෘත්ති ප්‍රකාශය ඇසුරින් ම පිළිතුරු ලබා දෙන්න.

(01) පහත සඳහන් ප්‍රශ්නවලට වාචික පිළිතුරු ලබා දෙන්න.

1. ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නේ කුමන රූපවාහිනී සේවයකින්ද?
2. ප්‍රවෘත්ති ප්‍රකාශයේ සිරස්තල කීයක් තිබේද?
3. ජල සම්පත විනාශ කිරීමට හේතුවන මිනිසාගේ අයහපත් ක්‍රියා මොනවාද?
4. මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගෙන් සහාය පතන්නේ කුමන සම්පත රැක ගැනීමට දායක වන ලෙසද?

Richmond College - Grade 3 - 2020

(02) ඉවතලන කාඩ්බෝඩ් පෙට්ටියකින් රූපවාහිණී ආකෘතියක් සකස් කර ඔබත් ඔබගේ " සිංහල පැවරම් " ( ඡේද කපන පොත ) පිටු අංක 14 හි තිබෙන එම ප්‍රවෘත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන්න. එම කොටස අභ්‍යාස පොතේ අලවන්න.


ප්‍රවෘත්ති ප්‍රකාශය

ආයුබෝවන්

මේ කලණ ළමා රූපවාහිනී සේවය යි.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ඉදිරිපත් කිරීම . . . . . . . . . . .

මුලින් ම සිරස්තල

- ජාතික මදුරු මර්දන සතියේ දී පාසල් පිරිසිදු කිරීමට පියවර ගනියි.
- ජල සම්පත රැක ගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගේ සහාය පතයි.

- ජාතික මදුරු මර්දන සතිය මාර්තු මස 29 දින සිට අප්‍රේල් මස 4 වැනිදා දක්වා පැවැත්වෙයි. මදුරු උවදුර රටපුරා වසංගතයක් වී ඇත. එබැවින් පාසල් සහ ඒ අවට පිරිසිදු කිරීම කඩිනමින් කළ යුතු කාර්යයකි. ඒ සඳහා සිසුන් සහ දෙමවුපියන්ගේ සහාය ලබාගත යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම් දෙයි.
- මිනිසාගේ එදිනෙදා කටයුතුවලට අවශ්‍ය වන්නේ ජලය යි. මේ වන විට අප රටේ ජල සම්පත විනාශ වෙමින් පවතී. මෙම අයහපත් ප්‍රතිඵල විඳීමට සිදුවන්නේ අනාගත පරපුරට යි. ජල සම්පත විනාශ වීමට හේතු වන්නේ මිනිසාගේ අයහපත් ක්‍රියා ය. ගස් කැපීම, කළුගල් කැඩීම, වැලි ගොඩ දැමීම ඒ අතර ප්‍රධාන වෙයි. මෙවැනි අයහපත් ක්‍රියාමාර්ග වළක්වමින් ජල සම්පත රැක ගැනීමට දායක වන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගේ සහාය පතයි.

ප්‍රවෘත්ති සමාප්ත යි.

(03) ප්‍රවෘත්ති ප්‍රකාශයේ සිරස්තල දෙක අභ්‍යාස පොතේ ලියන්න.

(04) නිවසේදී රූපවාහිනී ප්‍රවෘත්ති අසා දිනකට ඉන් එක පුවතක් බැගින් ලියන්න. එම ප්‍රවෘත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන්න. ( දින 3ක් )

**2020/05/27 බදාදා දිනට**

- ඔබ වෙත Whatsapp මගින් එවා ඇති Audio Clips නිවේදනයට දෙවතාවක් හොඳින් සවන් දීමට සලස්වා පහත සඳහන් ප්‍රශ්නවලට වාචික පිළිතුරු නිවේදනය ඇසුරින් ම ලබා ගැනීමට යොමු කරන්න.

(01) නිවේදනය ඇසුරින් වාචික පිළිතුරු ලබා ගන්න.

1) පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය පැවැත්වෙන්නේ කවදා ද?

2) උත්සව ආරම්භ වන වෙලාව කීයද?

3) උත්සවයේ ප්‍රදාන ආරාධිත අමුත්තා කවුද?

4) උත්සව දිනයේදී සිසුන් කළ යුතු දේ මොනවාද?

5) උත්සව ශාලාවේ දෙමවුපියන් අසුන් ගත යුතු වේලාව කීයද?

Richmond College - Grade 3 – 2020

(02) සිංහල පැවරුම් පොතේ පිටු අංක 14 හි තිබෙන ක්‍රියාකාරකම 3 - පියවර 1 අභ්‍යාස පොතේ අලවන්න.

නිවේදනය

> අප පාසලේ අලුතින් ඉදි කරන ලද පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය ජුනි මස 30 වන බ්‍රහස්පතින්දා පෙරවරු 8.30ට පැවැත්වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂතුමා සහභාගි වෙයි. එදින සියලු සිසුන් ප්‍රධාන ආරාධිත අමුත්තා පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව තෙක් දෙපස පෙළගැසී සිටිය යුතු ය. දෙමවුපියන් අනිවාර්යයෙන් උත්සවයට සහභාගි විය යුතු ය. ඔවුන් පෙරවරු 8.30ට පෙර ප්‍රධාන ශාලාවේ අසුන් ගත යුතු බව සංවිධායක මණ්ඩලය දැනුම් දෙයි.

(03) සිංහල පැවරුම් පොතේ පිටු අංක 14 හි තිබෙන ක්‍රියාකාරකම 3 ට අදාළ පියවර 3 කොටස හිස්තැන් පුරවා සම්පූර්ණ කරන්න. අභ්‍යාස පොතේ අලවන්න.

## 2020/05/28 බ්‍රහස්පතින්දා දිනට

(01) පහත සඳහන් මාතෘකාවට අදාලව පින්තූරයක් ඇඳ, වාක්‍ය 5ක් ලියන්න. (වාක්‍ය ලිවීමේදී තමා එම චරිතය යැයි සිතා ලියන්න. උදාහරණයක් ලෙසඃ සිංහල කියවීමේ පොතේ හරි පුදුමයි පාඩම බලන්න.)

<u>මොනරා</u>

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................

Richmond College - Grade 3 - 2020

(02) සිංහල කියවීම් පොතේ 13 පාඩම බදුලු ගමන ශබ්ද නඟා කියවීමට පවසන්න. පාඩම කියවන විට අදාළ තැනට ගැලපෙන හැඟීම් මතු කරමින් කියවීම සිදුකළ යුතු බව පැහැදිලි කරන්න.



13. පාඩම -බදුලු ගමන

(03) පහත වචන පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන්න.

1. දුම්රිය ස්ථානය
2. ප්‍රවේශපත්
3. වේදිකාව
4. ශබ්ද විකාශන යන්ත්‍රය
5. ආපණ ශාලාව
6. සංඥා

(04) බදුලු ගමන පාඩම ඇසුරින් වාචික පිළිතුරු ලබාගන්න.

01. දුම්රිය ගමනට සහභාගී වූ අය කවුද?
02. ප්‍රවේශපත් මිලදී ගත්තේ කවුද?
03. දුම්රියේ අවසාන පෙට්ටියේ සිටින සුදු ඇඳුමක් ඇඳගත් කෙනා කවුද?
04. රතු කොඩිය වනන අවස්ථා දෙක මොනවාද?
05. රාත්‍රියේදී දුම්රියට සංඥා ලබාදෙන්නේ කෙසේද?

**2020/05/29 සිකුරාදා දිනට**

(01) පෙරදින වාචික පිළිතුරු ලබාගත් ප්‍රශ්න සඳහා පිළිතුරු මව්බස ලිවීම පොතේ ලියන්න

01. දුම්රිය ගමනට සහභාගී වූ අය කවුද?

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

02. ප්‍රවේශපත් මිලදී ගත්තේ කවුද? ..................................................................

Richmond College - Grade 3 - 2020

03. දුම්රියේ අවසාන පෙට්ටියේ සිටින සුදු ඇඳුමක් ඇඳගත් කෙනා කවුද?

.............................................................................................................

04. රතු කොඩිය වනන අවස්ථා දෙක මොනවාද?

.............................................................................................................

.............................................................................................................

05. රාත්‍රියේදී දුම්රියට සංඥා ලබාදෙන්නේ කෙසේද?

.............................................................................................................

.............................................................................................................

. (02) පෙරදින විශේෂ අවධානයක් යොමු කරන ලද වචන රූලෙන් 3/4 ප්‍රමාණයට අසා ලියන්න.

**2020/06/01 සඳුදා දිනට**

(01) සිංහල වැඩ පොතේ 53 පිටුවේ සිට 55 පිටුව දක්වා (ක්‍රියාකාරකම 2 දක්වා) පැවරුම් සම්පූර්ණ කරන්න.

- **අවබෝධය**
- **ක්‍රියාකාරකම** 2
- **ක්‍රියාකාරකම** 3




(02) නිවාඩු කාලයේ කියවන ලද පොත් 5ක් ඇසුරෙන් සිංහල වැඩ පොතේ 41 පිටුව සම්පූර්ණ කරන්න.


ක්‍රියාකාරකම 4

ඔබ කියවූ පොත් පහක් ඇසුරෙන් පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

| | පොතේ නම | කතුවරයා |
|---|---|---|
| 1 | ........................ | ........................ |
| 2 | ........................ | ........................ |
| 3 | ........................ | ........................ |
| 4 | ........................ | ........................ |
| 5 | ........................ | ........................ |

Richmond College - Grade 3 – 2020